# ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 19 දරන

# දේශීය ආදායම් (ඇතැම් නිලධරයන්ගේ පදවි නාම වෙනස් කිරීම) පනත

[සහතිකය සටහන් කළේ 1975 අප්‍රේල් මස 17 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1975 මැයි මස 02 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

# ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 19 දරන දේශීය ආදායම් (ඇතැම් නිලධරයන්ගේ පදවි නාම වෙනස් කිරීම) පනත

[සහතිකය සටහන් කළේ 1975 අප්‍රේල් මස 17 වන දින]

එල්. ඩී.—ඕ. 40/74

**දේශීය ආදායම් කොමසාරිස්වරයාගේ, නියෝජ්‍ය දේශීය ආදායම් කොමසාරිස්වරයාගේ සහ සහකාර දේශීය ආදායම් කොමසාරිස්වර යන්ගේ පදවි නාම වෙනස් කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.

**1.** මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 19 දරන දේශීය ආදායම් (ඇතැම් නිලධරයන්ගේ පදවි නාම වෙනස් කිරීම) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1974 අගෝස්තු මස පළමු වන දින එය ක්‍රියාත්මක වූ ලෙස සියලු කාර්යයන් සඳහා සලකනු ලැබිය යුතු ය.

දේශීය ආදායම් කොමසාරිස්වරයාගේ, නියෝජ්‍ය දේශීය ආදායම් කොමසාරිස්වරයාගේ හා සහකාර දේශීය ආදායම් කොමසාරිස්වරයාගේ පදවි නාම වෙනස් කිරීම.

**2.** යම් ලිඛිත නීතියක හෝ යම් ලිඛිත නීතියක් මගින් හෝ යටතේ නිකුත් කරනු ලැබූ, සාදනු ලැබූ, නියම කරනු ලැබූ හෝ බලය දෙනු ලැබූ යම් දැන්වීමක, සන්දේශයක, ආකෘතියක හෝ වෙනත් යම් ලේඛනයක—

(අ) දේශීය ආදායම් කොමසාරිස්වරයා (එම පදවි නාමයෙන් ම හෝ කොමසාරිස්වරයා යන කෙටි පදවි නාමයෙන් හෝ) සඳහන් කරනු ලැබ ඇති සෑම පද සම්බන්ධයක දී "දේශීය ආදායම් කොමසාරිස්වරයා" යන වචන වෙනුවට "දේශීය ආදායම් කොමසාරිස්-ජනරාල්වරයා" යන වචන හා "කොම සාරිස්වරයා" යන වචනය වෙනුවට "කොමසාරිස්-ජනරාල් වරයා" යන වචනය ද ;

(ආ) නියෝජ්‍ය දේශීය ආදායම් කොමසාරිස්වරයකු (එම පදවි නාමයෙන් ම හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයා යන කෙටි පදවි නාමයෙන් හෝ) සඳහන් කරනු ලැබ ඇති සෑම පද සම්බන්ධයක දී "නියෝජ්‍ය දේශීය ආදායම් කොමසාරිස් වරයා" යන වචන වෙනුවට "දේශීය ආදායම් කොමසාරිස් වරයා" යන වචන හා "නියෝජ්‍ය කොමසාරිස්වරයා" යන වචන වෙනුවට "කොමසාරිස්වරයා" යන වචනය ද ;

(ඇ) සහකාර දේශීය ආදායම් කොමසාරිස්වරයකු (එම පදවි නාමයෙන් ම හෝ සහකාර කොමසාරිස්වරයකු යන කෙටි පදවි නාමයෙන් හෝ) සඳහන් කරනු ලැබ ඇති සෑම පද සම්බන්ධයක දී "සහකාර දේශීය ආදායම් කොමසාරිස් වරයා" යන වචන වෙනුවට "නියෝජ්‍ය දේශීය ආදායම් කොමසාරිස්වරයා" යන වචන හා "සහකාර කොමසාරිස් වරයා" යන වචන වෙනුවට "නියෝජ්‍ය කොමසාරිස්වරයා" යන වචන ද

නියමිත දිනයේ සිට බලපැවැත්වෙන පරිදි ආදේශ කරනු ලැබිය යුතු ය.

2 ඡ 12966—12,316 (75/02)